" ඌව අභියෝගයෙන් අභිමානයට "
# ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
UVA PROVINCIAL COUNCIL
ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය
ஊவா மாகாண பிரதான செயலாளர் அலுவலகம்
OFFICE OF THE CHIEF SECRETARY, UVA PROVINCE
රජ වීදිය, බදුල්ල. தொகுதி-இராஜ வீதி, பதுளை King's Street, Badulla
" විශිෂ්ඨතම ජනතා හිතවාදී පරිපාලනයක් "

මගේ අංකය / எனது இல / My No. } 4/P/DEV/2/4

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2018.05.02

**ක්‍රමසම්පාදන චක්‍රලේඛ අංක :- 02/2018**

ඌව පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

ඌව පළාත් සභාවේ සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

**<u>ඌව පළාත තුල ක්‍රියාත්මක වන විදේශ ආධාර ව්‍යාපෘති සඳහා පළාත් මෙහෙයුම් කමිටු වෙනුවෙන් දීමනා ගෙවීම.</u>**

විදේශ මූල්‍යාධාර යටතේ ඌව පළාත තුල විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වන අතර එම කටයුතු සැලසුම් කිරීමේදී , සම්බන්ධීකරණය කිරීමේදී , ක්‍රියාත්මක කිරීමේදී හා නියාමනය කිරීමේදී ඌව පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා ආයතන මැදිහත්වේ.

මෙම කටයුතු සාර්ථකව මෙහෙයුම්කරණය සඳහා පළාත් මෙහෙයුම් කමිටු පත්කරන අතර එම මෙහෙයුම් කමිටු සාමාජිකයන්ට තමන්ගේ මූලික රාජකාරි වලට පරිබාහිරව විදේශාධාර ව්‍යාපෘතීන්හි මෙහෙයුම් කටයුතු සඳහාද දායක වීමට සිදුවේ.

මෙම කාර්යය සඳහා ඇතැම් ව්‍යාපෘති මගින් මෙහෙයුම් කමිටු සමාජිකයින් සඳහා සාමාජික දීමනා ගෙවනු ලබන අතර, ඇතැම් මෙහෙයුම් කමිටු සඳහා දීමනා ගෙවනු නොලබයි. එසේම ගෙවනු ලබන දීමනාවන්හිද ඒකමතිකභාවයක් නොමැති බව නිරීක්ෂණය වී ඇත.

එබැවින්, ඌව පළාත තුල ක්‍රියාත්මක කරනු ලබන සියළුම විදේශාධාර ව්‍යාපෘති වල මෙහෙයුම් කටයුතු සාර්ථකව සිදුකර ගැනීම සඳහා අදාල ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රතිපාදන මගින් ගෙවීම් කටයුතු සිදු කිරීමට යටත්ව පහත සඳහන් පරිදි මෙහෙයුම් කමිටු වාරයකට සාමාජික දීමනා ගෙවීම අනුමත කරමි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 055-2222809
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) / பிரதி பிரதான செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Admin) } 055-2222203
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary } 055-2222899
ෆැක්ස් / தொலைநகல் / Fax } 055-2231670
ෆැක්ස් / தொலைநகல் / Fax } 055-2223977
ගණකාධිකාරී / கணக்காளர் / Accountant } 055-2229425
පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer } 055-2229426
පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephones } 055-2222804, 055-2222810, 055-2222818, 055-2222712

| අ.අ | ශ්‍රේණිය/තනතුරු | යෝජිත දීමනාව (රු.) |
|---|---|---|
| 01 | ඌව පළාතේ ප්‍රධාන ලේකම් | 5,000.00 |
| 02 | පළාත් අමාත්‍යාංශ ලේකම්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම් හෝ දීප ව්‍යාප්ත සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු දරණ නිලධාරියකු | 4,500.00 |
| 03 | පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියකු හෝ දීප ව්‍යාප්ත සේවයේ පලමු ශ්‍රේණියේ තනතුරු දරණ නිලධාරියකු | 4,000.00 |
| 04 | පළාත් ආයතන ප්‍රධානියකු හෝ දීප ව්‍යාප්ත සේවයේ දෙවන ශ්‍රේණියේ තනතුරු දරණ නිලධාරියකු | 3,000.00 |
| 05 | දීප ව්‍යාප්ත සේවයේ තුන්වන ශ්‍රේණියේ තනතුරු දරණ නිලධාරියකු | 2,000.00 |
| 06 | ඉහත තනතුරු වලට අයත් නොවන සාමාජිකයකු | 1,500.00 |

එසේම ඉහත සඳහන් මෙහෙයුම් කමිටු සංවිධාන හා සම්බන්ධීකරණ කටයුතු සඳහා අදාල මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියාට රු. 2,000.00 ක දීමනාවක් හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන අදාල මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරියාට රු.1,000.00 වශයෙන්ද දීමනාවක් ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රතිපාදන මගින් ගෙවීමද අනුමත කරමි.

ඒ අනුව, විදේශ ආධාර ව්‍යාපෘතීන්හි පළාත් මෙහෙයුම් කමිටු සඳහා දීමනා ගෙවීමේදී මෙම චක්‍රලේඛය පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

පී.බී. විජයරත්න
ඌව පළාතේ ප්‍රධාන ලේකම්